# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2010 මැයි මස 07 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2010.05.10 දින නිකුත් කරන ලදී)**

## පින සංවිධානය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**පින සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිස්ස අත්තනායක මහතා විසින්
පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනතට 2අ, 2ආ සහ 2ඇ යන වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිවල නීතිය බලපෑම වනුයේ පහත දැක්වෙන පරිදි ය:—

(1) 2අ වගන්තිය මගින් 1996 පෙබරවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයෙන් අවසන් වන කාලය තුළ අනුමත අර්ථසාධක අරමුදලට ගෙවන ලද එම අරමුදලින් අඩු කර ගන්නා ලද හෝ එයට ගෙවන ලද දායක මුදල් මෙම වගන්තිය මගින් නීත්‍යානුකූල බවට පත් කරයි.

(2) 2ආ වගන්තිය මගින් කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ වූ ප්‍රතිලාභවලට වඩා සේවා නියුක්තයන්ට අර්ථලාභී වූ ද, විශ්‍රාම වැටුප් අරමුදල් හෝ යෝජනා ක්‍රම මගින් වූ සේවය අවසන් කිරීමේ දී ගෙවනු ලබන ප්‍රතිලාභ අදාළ දිනයට පසුව ලබා ගැනීමට මෙම වගන්තිය මගින් යම් ආවරණ සේවා නියුක්තියක සේවයේ යෙදී සිටින යම් තැනැත්තකුට හැකි වේ.

(3) 2ඇ වගන්තිය මගින් 1996 පෙබරවාරි මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලයක් තුල සේවය අවසන් කිරීමේ දී ලබන ප්‍රතිලාභ ලබා දීමට අදාළව හෝ 2අ වගන්තියේ නිශ්චිතව දැක්වෙන කාලයට අදාළව යම් සේවා යෝජකයකුට හෝ සේවා නියුක්තයකුට 2 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බවට ප්‍රකාශයට පත් කරයි.

## පින සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"පින සංවිධානය සංස්ථාගත කිරීමේ)" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සංවිධානයක්, එකී සංවිධානයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා මෙතෙක් කල් ඇති කර තිබුණ හෙයින් ද:

එකී සංවිධානය ඇතිකරන ලද්දේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී සංවිධානයේ භාරකාර මණ්ඩලය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, ඒ සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2010 අංක  දරන "පින සංවිධානය" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පින සංවිධානය සංස්ථාගත කිරීම.

2. මෙම පනත ක්‍රියාත්මකවීමේ දින සිට හා ඉන්පසු (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) පින සංවිධානයේ සාමාජිකයන් සහ මින් මතු මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) "පින සංවිධානය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) විශේෂයෙන් යුද්ධ හමුදා රෝහල් ඇතුලු දිවයිනේ සියලුම රජයේ රෝහල් සඳහා නවීන රෝහල් උපකරණ සහ ඇම්බියුලන්ස් වැනි දේවල් ජර්මනියෙන් හෝ වෙනත් රටකින් ආනයනය කර පරිත්‍යාග කිරීම;

2-PL 004825 -100 (2010/05)

(ආ) ආර්ථික හෝ මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ පා සිටින ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා ධෛර්යය දීම හා උපකාර කිරීම;

(ඇ) අඩු ආදායම් ලබන පවුල්වල ශිෂ්‍යයන්ට හෝ මවුපියන් දෙදෙනාම, නැතහොත් ඔවුන්ගෙන් එක් අයෙකු මිය ගොස් ඇති ශිෂ්‍යයන්ට හෝ එවැනි යම් අවාසිකර අවස්ථාවලට මුහුණ පා සිටින ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ආධාර කිරීම සහ ක්‍රියාශීලී ලෙස ධෛර්යය දීම;

(ඈ) හෘද සැත්කම්, වකුගඩු බද්ද කිරීමේ හා පිළිකා සැත්කම් වැනි අවශ්‍යතාවයන්ගෙන් පෙළෙන දුගී දුප්පත් ජනතාවට එම සැත්කම් සඳහා සහන සැලසීම සහ වෙනත් ලෙඩ දුක්වල දී පිහිටවීම;

(ඉ) අනාථ නිවාස සහ මහලු නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ සමාජ සුභසාධන මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඊ) අඳ, ගොළු, බිහිරි සහ ආබාධිත තැනැත්තන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම සහ නිවර්ථන නිවාස පිහිටුවීම;

(උ) අසරණ සහ දුප්පත් ජනතාවට රෝද පුටු, කිහිලිකරු සහ ඇස් කණ්නාඩි ආදිය ලබා දීම ;

(ඌ) නිවාස නොමැති ජනතාව සඳහා නිවාස ඉදිකරදීම සහ ඉදිකිරීමේ කටයුතු නිම කර ගැනීම සඳහා ආධාර දීම;

(එ) දුෂ්කර ප්‍රදේශවල කෘෂිකර්මය නගා සිටුවාලීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ඉඩම් වාහන එම දුෂ්කර ප්‍රදේශ භාර දිස්ත්‍රික් ලේකම්වරයා හරහා ගොවීන්ට ලබා දීමට කටයුතු කිරීම;

(ඒ) පහසුකම් අවම දුෂ්කර ප්‍රදේශවල රෝහල් සඳහා ගිලන් රථ ලබා දීම;

(ඔ) රජයේ පාසැල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව අනුව ගමනාගමන පහසුව උදෙසා බස් රථ ලබා දීම;

(ඕ) ප්‍රජා පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම;

(ක) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමෙහිලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම;

(ඛ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සමිති සමාගම් හෝ සංවිධාන සමග සහයෝගීවීම හා සහචර්ය වීම;

(ග) දැනට ශ්‍රී ලංකාවේ පවතින සියදිවි නසාගැනීමේ ප්‍රවණතාවය අවම කර ගැනීම සඳහා හෝ එය තුරන් කිරීම සඳහා කටයුතු කිරීම; සහ

(ඝ) සංස්ථාවේ මතය අනුව ඉහත සඳහන් යමකට සම්බන්ධ සංවර්ධනයට උපකාරී වන වෙනත් සියලු දේ ඉටු කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනයේ යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් සහ කිරීම ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන පාලකවරුන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ (මෙහි මින් මතු “සභාව”

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී, පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දරුවා වූ ද සංස්ථාවේ ප්‍රථම පාලක සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සභාවට අවශ්‍ය වුවහොත් නව සාමාජිකයන් පත් කිරීමට ද පුරප්පාඩු ඇතිවුවහොත් සාමාජිකයින් පත් කිරීමට ද බලය සභාව සතු වන්නේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ යම් රීතියක් ඒ රීතිය, සාදනු ලැබූ ආකාරයෙන්ම එවැනි ම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට ලැබිය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා බේරුම් කළ යුතු අතර, එදිනට පදනමට ලැබිය යුතුව තිබුණු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් ලැබුණා වූ හෝ මින් මතු ලැබෙන ත්‍යාග, අන්තිම කැමති පත්‍රයකින් පැවරීම, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

**ගිණුම් හා විගණනය.**

9. (1) සංස්ථාවට ලැබුණු හෝ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව සංස්ථාව විසින් නිසි අයුරින් ගිණුම් තැබීමට සැලැස්විය යුතු ය.

(2) වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින්, සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව තහවුරු කළ යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

10. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

11. යම් මිලට ගැනීමක්, දායක මුදලක්, ත්‍යාගයක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව. ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.**

12. සංගමය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංගමයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

13. මේ පනතේ සඳහන් තැනැත්තනගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය සංස්ථාගත මණ්ඩලයක හෝ යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.